# දෙව්නුවර ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

---------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 09 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට දෙව්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.355,971 ක් වූ ප්‍රාග්ධන වියදම් සභා අරමුදලින් දරා තිබුණද ඒ සඳහා වැයකළ මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු පර්චස් 23 ක ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති දෙකක් සඳහා වැඩ යෝජනාව පමණක් ලැබී තිබූ අතර ඇස්තමේන්තු සකස් කිරීමක් හෝ ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ ගිවිසුම්ගතවීමක් සිදුවී නොතිබුණ නමුත් ඒ වෙනුවෙන් රු.5,000,000 ක ණයගැතියන් හා ණයහිමියන් ප්‍රතිපාදනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ණයගැති හා ණයහිමි වටිනාකම එම ප්‍රමාණයන්ගෙන් අධිගණනය වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව අපරැකුගම ප්‍රධාන මාර්ගයේ රුක්ගහ හන්දියේ පැති බැම්ම ඉදිකිරීම් කර්මාන්තය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන රු.1,000,000 ක් වූ අතර කර්මාන්ත ණයහිමි ලේඛනයට අනුව එකී අගය රු.200,000 ක් ලෙස නිරීක්ෂණය වූයෙන් ණයහිමියන් රු.800,000 ක් වැඩිපුර ප්‍රතිපාදනය කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුද්ගලයෙකුට ගෙවිය යුතු මුදල රු.818,567 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.1,118,567 ක් ලෙස ණයහිමියන් යටතේ පෙන්වා තිබීම හේතුවෙන් ණයහිමියන් රු.300,000 කින් අධි ගණනය වී තිබුණි.

(ඊ) සභාවට අයත් අංක 1-0039-01-3808-8 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු.24,195 ක මුදල ගිණුම් වලින් අත්හැරී තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශේෂයන්ගේ එකතුව රු.5,134,786 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව හා දෙන ලද තොරතුරු අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.494,855 ක් වූයෙන් රු.4,639,931 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,042,575 ක් විය.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,108,386 ක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් මාරු කිරීමේ ගිණුමේ දැක්වෙන රු.821,995 ක මුදල 2008 වර්ෂයේ සිට දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පවතින අතර එය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.66,413,135 ක් වටිනා ගිණුම් විෂයයන් 05 කට අදාලව ස්ථාවර වත්කම් ලේඛන, ඉන්වෙන්ට්‍රි ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.6 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 217-218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එසේ කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,479,190 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,261,579 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,801 | 3,806 | 3,130 |
| බදුකුලී | 15,689 | 16,837 | 9,174 |
| වෙනත් ආදායම් | 16,202 | 12,987 | 7,698 |

2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ බිල්කර තිබුණු වරිපනම් බදු මුදල රු.1,964,721 ක් වූ අතර එකී මුදලින් වර්ෂය තුල අයකර ගෙන තිබුනේ රු.888,681 ක් පමණක් වූයෙන් අය කිරීමේ ප්‍රගතිය සියයට 59 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟහිටි වරිපනම් බදු රු.1,171,321 ක් වූ අතර ඉන් රු.563,113 ක් අයකර ගෙන ඇති අතර අයවීමේ ප්‍රගතිය සියයට 20 ක් විය.

2.2.3 බදුකුලී

සමාලෝචිත වර්ෂයේ ආරම්භක බදුකුලී මුදල රු.215,898 ක් වූ අතර සමාලෝචිත වර්ෂයට බිල් කළ මුදල රු.6,114,556 ක් විය. සමාලෝචිත වර්ෂය තුල මුළු ලැබීම් රු.4,177,982 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාලව අයවීමේ ප්‍රතිශතය සියයට 68 ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 15,710,989 |
| මුද්දර ගාස්තු | 367,111 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 ඡේදය ප්‍රකාර දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරීන්ගෙන් අයකරන සියයට 4.2 පොලී අනුපාතය අතර වෙනස රජය මගින් ප්‍රතිපූර්ණය කළ යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා රු.949,047 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණද එකී මුදල ප්‍රතිපූර්ණය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 බලය නොළත් ගනුදෙනු
-----------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 ඒ වගන්තිය ප්‍රකාර ප්‍රජා පිළිගැනීම් සම්බන්ධයෙන් හෝ පොදු වැදගත්කමකින් යුත් සිදුවීමක් වෙනුවෙන් සභා අරමුදලින් රු.1,000 කට වැඩි වියදමක් දරන්නේ නම් ඒ සඳහා අදාල අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී රු.108,023 ක උත්සව වියදම් දරා තිබුණි.

3.3 නිෂ්ක්‍රීය වත්කම්
-----------------

සභාවට අයත් අංක 1-0039-01-3808-8 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු ගිණුම 2005 මැයි 30 දින රු.22,400 කින් ආරම්භ කර තිබූ අතර 2007 අගෝස්තු 29 දිනට රු.24,195 ක ශේෂයක් පැවතියද ඉන් පසුව ගිණුම යාවත්කාලීන කර නොතිබුණි. .

3.4 ව්‍යාපෘතිය අත්හැර දැමීම
---------------------------

බෝමුරේ පන්සල අසල සිට වාඩිගල සුනාමි ගම්මාන දක්වා පාර තාර දමා සංවර්ධනය කිරීම සඳහා එක්තරා සමිතියක් සමඟ 2014 අගෝස්තු 11 දින රු.2,000,000 ක වටිනාකමට සභාව ගිවිසුම් ගතවී තිබුණි. මෙම ව්‍යාපෘතිය දින දීර්ඝ කිරීමක්ද රහිතව අත්හැර දමා තිබූ බව 2015 ජූනි මස 22 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

3.5 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| තෘතියික | 03 | 03 | - | - |
| ද්විතියික | 21 | 19 | 02 | - |
| ප්‍රාථමික | 44 | 31 | 13 | - |
| ආදේශක | - | 14 | - | 14 |
| | 68 | 67 | 15 | 14 |

(i) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.17,154,500 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල වැටුප් හා සභික දීමනා ලෙස රු.24,851,869 ක මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.7,697,369 ක මුදලක් අතිරේක වැය බරක් වී තිබුණි.

(ii) 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටවිය යුතු බව දක්වා තිබුණද සභාව 2014 වර්ෂයේදී සේවකයින් 14 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස රු.2,967,595 ක මුදලක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී අයවැය ලේඛනය සඵල පාලන කාරකයක් ලෙසට යොදා ගෙන නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන
---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ගබඩා පාලනය